පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492
ආයතනයේ නම - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර
පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற அமர்வு இல : 492
நிறுவனத்தின் பெயர் : கால்நடை உற்பத்தி சுகாதார திணைக்களம

பாராளுமன்றத்தின் அரச கணக்குகள் பற்றிய குழுவினால் சபையில் முன்வைக்கப்பட்ட தலைவியறு கட்டளை 119(4) தொடர்பில் கண்காணிப்பு மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்பித்தல்.(2023)

Parliamentary Session No. - 492
Name of the Institution - Department Of Animal Production and Health

Presenting observations and actions taken regarding the report submitted to Parliament by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4).(2023)

( ආකෘතිය - අංක : 01 )

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද , 2023 මාර්ගගත තොරතුරු කළමනාකරණ වාර්තාවේ නිරීක්ෂණ සම්බන්ධවයි

ආයතනය : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**පළමු කොටස : 85 .00**

| අනු අංකය | රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාව අනුව විගණන කරුණ | ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය |
|---|---|---|
| 01. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | ප්‍රාදේශීය කාර්යාල වලින් තොරතුරු කැඳවීම කර පිළිතුරු සැකසීම සිදු කරනු ලබන අවස්ථාවන්හිදී පවතින තත්වය පිළිබඳව දැනුම් දී අතුරු පිළිතුරු යොමු කිරිම මෙන්ම අමතර කාලයක් ඉල්ලුම්කර හෝ පිළිතුරු ලබා දීමට කටයුතු කර ඇත. තව ද මෙම තත්වයන් අවම කිරීම සඳහා අදාල වර්තාවන් ඊ මෙල් මඟින් ලබා ගැනීම සිදු කරනු ලබයි. |
| 02. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේ දී බොහෝ විට ලබා දුන් කාල සීමාව තුළ පිළිතුරු යොමු කරනු ලබයි. නමුත් පශු විමර්ශන මධ්‍යස්ථාන වැනි ප්‍රාදේශීය කාර්යාල වලින් තොරතුරු කැඳවීම් කර පිළිතුරු සැකසීම සිදු කරනු ලබන අවස්ථාවන්හිදී පවතින තත්වයන් පිළිබඳ දැනුම් දී අතුරු පිළිතුරු යොමු කිරිම මෙන්ම අමතර කාලයක් ඉල්ලුම් කර හෝ පිළිතුරු ලබා දීමට කටයුතු කර ඇත. මෙම තත්වයන් අවම කිරීම සඳහා අදාල වාර්තාවන් ඊ මෙල් මඟින් ලබා ගැනීම සිදු කරනු ලබයි. |
| 03. | සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ පළමු කාර්තුවට අදාල දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.03.21 දින හා දෙවන හා තෙවන කාර්තු වලට අදාල රැස්වීම 2023.10.03 වන දින ද පවත්වා ඇත . ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ ස්ථිර නිලධාරියෙකු නොසිටි බැවින් අදාල රැස්වීම් කටයුතු නියමිත පරිදි පැවැත්වීමට නොහැකි වූ බව කාරුණිකව සඳහන් කරමි. |
| 04. | සියලුම වාහන වල අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ලියකියවිලි නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව සතු සියලුම වාහනවල අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. පවතින ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ඇතැම් වාහන වල පවරා ගැනීමේ ක්‍රියාවලිය තරමක් ප්‍රමාද වී ඇති බව කාරුණිකව සඳහන් කරමි. |
| 05. | සියලුම පොදු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි . | මේ වන විට පින්තාරු නොකරන ලද රජයේ වාහන සඳහා රාජ්‍ය ලාංඡනය ස්ටිකරයක් ඇලවීම මඟින් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| 06. | වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි. | අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීම සඳහා පත් කරන ලද කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ රාජ්‍ය මුදල් චක්‍රලේඛ : 02/2015 ප්‍රකාරව ලබා දී නොමැති හා අපහැදිලි බැවින් නැවත කමිටුවක් පත් කර නිර්දේශ ලබා ගෙන වාහන අපහරණය කිරීමට අදාල කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. |
| 07. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | I. ඩී.එස්.පී. අමරසේන මිය<br>මෙම නිලධාරිණියගේ හිඟ ණය ශේෂය මරණ පරිත්‍යෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.<br>II. ඩී.එම්.එස්.බී.දිසානායක මහතා<br>මෙම නිලධාරියා සේවය හැර ගොස් ඇති බැවින් , ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙස කරන ලද ඉල්ලීම අනුව එය සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව යොමු කර ඇත. |
| දෙවන කොටස :76.00 | | |
| 01. | මුළු කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි කාර්ය සාධන ගිවිසුම් කෙටුම්පත් කර හෝ අත්සන් කර නොතිබුණි. | මෙ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරමින් පවතී. |
| 02. | සියලුම රජයේ නිලධාරීන් තමන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගත යුතු නිලධාරීන් ප්‍රමාණය 138 ක් වන අතර ලබා නොදුන් නිලධාරීන් සඳහා ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. |
| 03. | මුදල් රෙගුලාසි 156 (1 ) අනුව , නිලධාරීන්ව විසින් රජයට සිදු කරන ලද අලාභය අය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩුව වෙනුවෙන් මු.රෙ. 156 (1) ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කර ඇති අතර වර්තමාන ප්‍රගතිය ඇමුණුම - 01 මඟින් දක්වා ඇත. |

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග
අමාත්‍යාංශය .

D.P. Wickramasinghe
Secretary
Ministry of Agriculture, Livestock, Lands & Irrigation
80/5, "Govijana Mandiraya", Rajamalwatta Road
Battaramulla.

වෛද්‍ය බී.එස්.එස්.පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල් ( වැ. බ.)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

වෛද්‍ය බී. එස්. එස්. පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය

පහත නම සඳහන් නිලධාරීන්ගෙන් අදාල මුදල් අයකර ගැනීමට අදාලව වර්තමාන ප්‍රගතිය

| අනු අංකය | නිලධාරියාගේ නම | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 01 | ජේ.එම්.කේ.ජී. ජයසුන්දර මිය | • ජේ.එම්.කේ.ජී. ජයසුන්දර මිය ඕස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාල ආචාර්ය උපාධිය හැදෑරීමට 2013.02.08 දින ගිවිසුමකට එළඹ ඇත. එහි ඇප බැදුම්කරය රු. 9,758,659.40 ක් හා දණ්ඩන මුදල රු. 1,098,000.00 ක් විය. ඇප මුදල අයකර ගැනීම සඳහා දඹුල්ල , දිසා අධිකරණයේ පැවරූ MR /2287 අංක දරණ නඩුවෙන් සම්පූර්ණ ඇප මුදල අයකර ගෙන ඇත.<br><br>• ඉතිරි මුදල වූ රු. 1,098,000.00 ක දණ්ඩන මුදල අයකර ගැනීමට කොළඹ , දිසා අධිකරණයේ DMR/3718/2022 අංක දරණ නඩුව 2022.12.21 වන දින පවරා ඇත. එය 2025.11.04 දින විභාග වූ අතර නැවත 2026.06.19 දින නඩුව පැවත්වීමට නියමිතය. |
| 02 | ලතාමනී ඉන්ද්‍රකුමාර් මිය | • ලතාමනී ඉන්ද්‍රකුමාර් (කදිරේසම් පිල්ලෙයි ලතාමනී) මිය 2006.04.25 දින සිට 2008.04.25 දින දක්වා කැනඩාවේ රැකියාවක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ඇත. ඊට අදාල ගිවිසුමකට එළඹ ඇත. පසුව එම ගිවිසුම 2009.04.24 දින දක්වා වසරකින් දීර්ඝ කර තිබේ. ඒ අනුව අයකර ගත යුතු දණ්ඩන මුදල රු. 435,200.00 කි.<br><br>• මගේ DAPH/AD/26/5/36 හා 2025.05.23 දිනැති ලිපියෙන් පෞද්ගලික ලිපි ගොනුවට ලබා දී ඇති ඇයගේ පෞද්ගලික ලිපිනයට විදේශගත වීමේදී අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව 435,200.00 ක දණ්ඩන මුදල කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා යොමු කළ ද අදාල ලිපිය නැවත දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත.(ඇමුණුම - I )<br><br>• මගේ අංක : DAPH/AD/26/5/36 හා 2025.05.26 දිනැති ලිපියෙන් විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් හා කැනඩාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් දැනුවත් කර ඇත. (ඇමුණුම - II )<br><br>• ලතාමනී ඉන්ද්‍රකුමාර් මිය ගෘහ අංක : 702/42, අලුත් මාවත , කොළඹ , 15 යටතේ හෝ දිවයිනේ කුමන හෝ ස්ථානයක ඡන්දහිමි නාම ලේඛනයේ 2023/2024 වර්ෂයට අදාලව ලියාපදිංචි ද යන්න මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙතින් මගේ අංක : DAPH/AD/ 26/5/36 හා 2025.09.02 දිනැති ලිපියෙන් විමසා අදාල තොරතුරු ලබා ගෙන ඇත. |

| | | |
|---|---|---|
| | | • ලතාමනී ඉන්ද්‍ර කුමාර් මිය රටින් බැහැරව ගොස් තිබේද යන්න පිළිබඳ තහවුරුවක් ලබා දෙන මෙන් මගේ අංක : DAPH/AD/ 26/5/36 හා 2025.09.02 දිනැතිව ආගමන විගමන පාලක ජනරාල් වෙත ලිපියක් යොමුකර ඇත. (ඇමුණුම - III )<br><br>• ලතාමනී ඉන්ද්‍රකුමාර් මිය ශ්‍රී ලංකාවට පැමිණීමේදී ඒ බව දැනුම් දෙන ලෙස මගේ අංක: DAPH/AD/26/5/36 හා 2025.11.20 දිනැති ලිපියෙන් ආගමන විගමන පාලක ජනරාල් වෙත ලිපියක් යොමුකර ඇත. |
| 03 | ඩී.එම්.ඩබ්.සී.බී. දිසානායක මයා | ඩී.එම්.ඩබ්.සී.බී. දිසානායක මයා 2016.06.14 සිට 2021.06.02 දක්වා රැකියාවක් සඳහා පිජි දූපතට යාමට වැටුප් රහිත නිවාඩු ලබා ගිවිසුමකට අත්සන් කර ඇත. අදාල දණ්ඩන මුදල වන රු. 2,022,013.00 මුදල අයකර ගැනීම සඳහා මහනුවර දිසා අධිකරණයේ නඩුවක් ගොනු කිරීමට අදාල ලේඛන හා පෙරකලාසි රජයේ නීතීඥ වෙත 2025.01.17 දින භාර දී ඇත. ඔහු ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් ඔහුගේ පදිංචි විදේශ ලිපිනයට දැනුවත් කිරීමට අමාත්‍යාංශ ලේකම් මගින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මාගේ අංක : DAPH/AD/5/09/02 හා 2025.11.12 දිනැති ලිපියෙන් දන්වා යවා ඇත.<br><br>ඩී.එම්.ඩබ්.සී.බී. දිසානායක මයා ශ්‍රී ලංකාවට පැමිණීමේ දී ඒ බව දැනුම් දෙන ලෙස මගේ අංක: DAPH/AD/26/5/36 හා 2025.11.20 දිනැති ලිපියෙන් ආගමන විගමන පාලක ජනරාල් වෙත ලිපියක් යොමුකර ඇත. |
| 04 | නන්දා නායකරත්න මිය | • නන්දා නායකරත්න මිය 1991.06.07 දින සිට 1994.12.31 දින දක්වා රැකියාවකට ඕස්ට්‍රේලියාවට යාමට වැටුප් රහිත නිවාඩු ලබා ගිවිසුමකට අත්සන් තබා ඇත. ඊට අදාලව අයකර ගත යුතු වන දණ්ඩන මුදල වන රු. 98,049.00 ක මුදල අයකර ගැනීමට මහනුවර දිසා අධිකරණයේ 29052 /MR නඩුව 2012.12.11 දින ගොනුකර ඇත. 2023.04.27 වන දින මෙම පැමිණිල්ල ලිපිනය සොයාගත නොහැකි වීම නිසා නිෂ්ප්‍රභ කර ඇත.<br><br>• මගේ අංක:DAPH/AD/18/01/60 හා 2025.03.30 දිනැති ලිපියෙන් මෙම නිලධාරිනිය නැවත ලංකාවට පැමිණීමේදී ඒ පිළිබඳ මෙම දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලෙස ආගමන විගමන පාලක ජනරාල්ට දන්වා ඇත. (ඇමුණුම - IV ) |

| | | |
|---|---|---|
| | | • මගේ අංක : DAPH/AD/18/01/60 හා 2025.04.10 දිනැති ලිපියෙන් පෞද්ගලික ලිපි ගොනුවට ලබා දී ඇති ඇයගේ පෞද්ගලික ලිපිනයට විදේශගත වීමේදී අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව 98,049.63 ක දණ්ඩන මුදල කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා යොමු කළ ද අදාල ලිපිය නැවත දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත (ඇමුණුම - V )<br>• ඇයගේ ලිපිනය සොයා ගැනීමට නොහැකිවීම මත 2015.08 න් පසු 29052 12 /එම් ආර් නඩුව ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය කරන බවත් මුදලේ අගය ක්‍රමයෙන් අවප්‍රමාණය වීමත් සමඟ රු .98049.00 ක මුදලක් අය කර ගැනීම ප්‍රායෝගික නොවන බැවින් ඉදිරි කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත ( ඇමුණුම - VI )<br>• ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතඥ රිස්නි පිර්දවුස්ගේ අංක C/10/1997 (CJ) හා 2022.10. දිනැති ලිපියෙන් නඩු අංක 29052 31 /එම්ආර් නඩුව ඉල්ලා අස්කර ගැනීම සඳහා පියවර ගන්නා බව දැනුම් දී ඇත (ඇමුණුම - VII )<br>• 2024.04. දිනැතිව නඩු අංක 29052 27 එම්/ආර් දරන නඩුව නිෂ්ප්‍රභා කිරීමට කටයුතු කර ඇත.<br><br>එබැවින් ඇයගෙන් රජයට අයවිය යුතු දණ්ඩන මුදල පොතෙන් කපා හැරීම පිළිබඳව අමාත්‍යාංශ විගණන කළමනාකරණ කමිටු වලදී සහ දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු වලදී සාකච්ඡාවට බඳුන්වී ඇත. එබැවින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ : 2/2024 ප්‍රකාරව එම්. නන්දා නායකරත්න මියගෙන් රජයට අයවිය යුතු රු. 98,049.63 ක මුදල පොතෙන් කපා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතිය ලබාදෙන මෙන් මාගේ අංක: DAPH/AD/18/1/60 හා 2026.02.10 දිනැති ලිපියෙන් ඉල්ලා ඇත. |
| 05. | යූ.එස්.එන්. ජයරත්න මිය | මගේ අංක : DAPH/AD/05/09/01හා 2025.10.31 දිනැති ලිපියෙන් යූ.එස්.එන්. ජයරත්න මිය වෙත අදාල හිඟ මුදල වන රු.94812.50 මුදල ගෙවන ලෙසටත් එසේ නොමැති නම් නීති ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වා යවා ඇත. මගේ අංක : DAPH/AD/05/09/01 හා 2026.02.20 දිනැති ලිපියෙන් මෙම නිලධාරිනියගෙන් අදාල මුදල අය කරගැනීමට අදාල නඩුවෙහි වර්තමාන තත්වය විමසා ලිපියක් යොමු කර ඇත. |

ඇමුණුම - I


# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
# கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
# Department of Animal Production and Health

+94-081-2388195

කාර්යාලය
அலுவலகம் +94 081-2388120
Office 184/189/337/462

Web : www. daph.gov.lk


දිනය :2025.05.23

අංක : DAPH / AD/26/5/36

ාමනී ඉන්ද්‍රකුමාර් මිය,
702/42,
ත් මාවත,
ාළඹ 15.

**ේශගතවී නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් රජයට අයවිය යුතු දණ්ඩන මුදල් අයකර ගැනීම ම්බන්ධවයි.**

බ මෙම දෙපාර්තමේන්තුවෙහි පශු වෛද්‍ය නිලධාරිණියක ලෙස සේවය කරමින් සිට 2004.09.26 දින සිට 009.04.24. දක්වා අධ්‍යයන කටයුතු සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන ඇත. 2009.04.25 දින වැටුප් රහිත විදේශ නිවාඩු අවසන් වුවද ඔබ නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් මාගේ අංක /22/5/36 හා 2009.06.24 දිනැති ලිපියෙන් ඔබ වෙත තනතුර අතහැරයාමේ නියෝගය නිකුත්කර ඇත.

02. ඒ අනුව ඔබ විදේශගත වීමේදී අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව රු. 435,200.00 ක දණ්ඩන ුදලක් ශ්‍රී ලංකා රජය වෙත ගෙවිය යුතුව ඇත. අදාල දණ්ඩන මුදල ගෙවන ලෙස මීට පෙර ඔබව දැනුවත් කළද මේ දක්වා ඊට ප්‍රතිචාර ලැබී නොමැත. තවද අදාල දණ්ඩන මුදල මේ දක්වා ගෙවීම ඔබ විසින් පැහැරහැර ඇති බැවින් එම මුදල කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

03. තවද ඔබ විසින් මෙම මුදල ගෙවීම පැහැර හැරියහොත් අදාල මුදල අයකර ගැනීම සඳහා කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ඔබට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කරන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි

ඩබ්.එම්.ටී.ඩී.කේ. වීරකෝන්
අධ්‍යක්ෂ (පරිපාලන)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

ිටපත :

01 .නීතිපති , - කරු.නීති කටයුතු ආරම්භ කිරීම සඳහා
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12

# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
# கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
# Department of Animal Production and Health

081-2388195

කාර්යාලය
அலுவலகம்
Office
+94 081-23881
184/189/337/4

Web : www.daph.gov.lk


අංකය : DAPH / AD/26/5/36

දිනය :2025.05. 26

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මගින්

ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය මගින්

අධ්‍යක්ෂ ජනරාල් ,
කොන්සියුලර් අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය මගින්

මහකොමසාරිස්,
ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය, ඔටාවා, කැනඩාව

<u>විදේශගතවී නැවත සේවයට වාර්තා නොකිරීම මත රජයට අයවිය යුතු දණ්ඩන මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම පශු -වෛද්‍ය නිලධාරී ලතාමනී ඉන්ද්‍රකුමාර් මිය .( ජා.හැ.අං. 685490226 V)</u>
**<u>( 2005.04.27 - 2010.04.27 දින දක්වා වලංගු විදේශ ගමන් බලපත්‍ර අංකය N 1461258 )</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2019.12.23 සහ 2022.10.07 දිනැති ලිපි හා බැදේ. (ඇමුණුම 01,02)

02. උක්ත නම සඳහන් නිලධාරිණිය පශු වෛද්‍ය නිලධාරිණියක ලෙස 2000.05.15 දින සිට මෙම දෙපාර්තමේන්තුවෙහි සේවය කරන ලදී. ඇය 2006.04.25 සිට 2008.04.25 දක්වා වැටුප් රහිත මාස 24 ක විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා ඒ සඳහා ගිවිසුමක් 2006.04.20 වන දින අත්සන් කර ඇත. (ඇමුණුම 03 )

03. ඇය නැවත 2008.04.26 දින සිට 2010.10.31 දක්වා වැටුප් රහිත විදේශ නිවාඩු කාලය දීර්ඝ කරදෙන ලෙස ඉල්ලීමක් 2008.04.02 දිනැතිව ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීමට අනුව පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක එල්ඒ/03/01/43 (1) හා 2008.05.30 දිනැති ලිපියෙන් වැටුප් රහිත නිවාඩු කාලය 2008.04.25 සිට 2009.04.24 දක්වා වසරක කාලයට පමණක් දීර්ඝ කිරීම අනුමත කර ඇති (ඇමුණුම 04 ) නමුත් වැටුප් රහිත විදේශ නිවාඩු අවසානයේ 2009.04.25 දින නිලධාරිණිය සේවයට වාර්තාකර නොමැත.

04. ඒ අනුව මගේ අංක ප/22/5/36 හා 2009.06.24 දිනැති ලිපියෙන් මෙම නිලධාරිණියට තනතුර හැරයාමේ නිවේදනය නිකුත් කර ඇත. (ඇමුණුම 05) නමුත් එම නිලධාරිණියගෙන් රජයට තවදුරටත් අයවිය යුතු දණ්ඩන මුදල ලෙස රු. 435,200.00 ක් අයකර ගත යුතුවන අතර එම මුදල මේ දක්වා අයකර ගැනීමට හැකියාව ලැබී නොමැත.

05. තවද මගේ අංක DAPH/AD/18/විග/2018/02 හා 2021.12.29 දිනැති ලිපියෙන් විදේශ ගතවී නැවත සේවයට වාර්තා නොකළ නිලධාරීන්ගේ වර්තමාන ලිපිනයන්, ඊ මේල් ලිපිනයන් හෝ දුරකථන අංකයන් ලබාදෙන ලෙස ආගමන විගමන පාලක ජනරාල් වෙතින් ඉල්ලීමක් සිදු කරන ලදී. (ඇමුණුම 06) ඒ අනුව ආගමන විගමන පාලක ජනරාල්ගේ අංක DIE/ IT/06/10 හා 2022.01.07 දිනැති ලිපියෙන් එම නිලධාරිණියගේ වර්තමාන විදේශ ලිපිනයන් හෝ ඊ මේල් ලිපිනයන් ආගමන විගමන දෙපාර්තමේන්තු ...ව පද්ධතිය සතුව නොමැති බව දන්වා ඇත. තවද ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින්

පවත්වාගෙන යනු ලබන ප්‍රත්‍යන්ත පාලන වාර්තා වලට අනුව එම නිලධාරිණියගේ ජී...
තොරතුරු , ගුවන් ගමන් විස්තර හා පරිලෝකන ගත පිටපත් ඉදිරිපත්කර ඇත. (ඇමුණුම 07)

06. ඒ අනුව උක්ත නම සඳහන් ලතාමනී ඉන්ද්‍ර කුමාර් යන අය විදේශගත වීමේදී ලබාදුන් ලි...
වන 97, BERGEN ROAD , SCARBORUGH, ONTORIO, M1P1S3, CANADA යන ලිපිනයට නී...
දෙපාර්තමේන්තුව විසින් යොමු කළ සිතාසිය භාර දිය නොහැකි වූ බවත් ස්ථිර ලිපිනය නොමැතිවී...
නඩු පැවරිය නොහැකි බවත්, ස්ථිර ලිපිනය ඉදිරිපත්කරන තෙක් ගොනුව තාවකාලිකව වසා ...
බවත් අංක C/246/2013 හා 2015.10.01 දිනැති ලිපියෙන් නීති පති දෙපාර්තමේන්තුව විසින් මා...
දන්වා ඇත.

07. ඒ අනුව පශු වෛද්‍ය නිලධාරී ලතාමනී ඉන්ද්‍රකුමාර් මියගෙන් රජයට අයවිය යුතු දණ්ඩන
අයකර ගැනීමේ ඉදිරි කටයුතු සඳහා ඇයගේ වර්තමාන පදිංචි ලිපිනය හෝ ඇයව සම්බන්ධකරගත...
වෙනයම් තොරතුරක් සම්බන්ධයෙන් මා දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉ...
සිටිමි.

08. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

o/c

[illegible] : DAPH / AD/26/5/36 දිනය :2025.04.

ආගමන විගමන පාලක ජනරාල්,
ආගමන විගමන දෙපාර්තමේන්තුව,
[illegible],
ශ්‍රී [illegible],
[illegible].

**විදේශගතවී නැවත සේවයට වාර්තා නොකිරීම මත රජයට අයවිය යුතු දණ්ඩන මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම පශු -වෛද්‍ය නිලධාරී ලතාමනී ඉන්ද්‍රකුමාර් මිය .**

මෙම දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය නිලධාරිනියක වශයෙන් සේවය කරමින් සිටි ලතාමනී ඉන්ද්‍රකුමාර් මහත්මිය (ජා.හැ.අ.685490226 V) 2006.04.25 සිට 2009.04.24 දින දක්වා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා රැකියාවක් සඳහා විදේශ ගතවී ඇත. ඇය අනුමත නිවාඩු කාලය අවසානයේදී නියමිත පරිදි සේවයට වාර්තාකර නොමැත.

02. එම නිසා ඇය විසින් විදේශගත වීමේදී ශ්‍රී ලංකා රජය සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව රු. 1[illegible],200.00 ක මුදලක් ශ්‍රී ලංකා රජය වෙත ගෙවිය යුතුව ඇත. එම මුදල ගෙවන ලෙස දන්වා ඇයට යොමු කරනු ලබන ලිපි නැවත මෙම කාර්යාලයට ලැබෙන බැවින් ඇයගේ වර්තමාන පදිංචිය පිළිබඳ ගැටළුවක් ඇත. එබැවින් ඇය මේ වන විට රටින් බැහැරව ගොස් තිබේද යන්න පිළිබඳව [illegible] ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. මේ සම්බන්ධයෙන් ලැබෙන සහය ඉතා අගය කරමි.

[illegible]එම්.එස්.එස්.බී. ජයසිංහ
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

ඇමුණුම - IV

මගේ අංක : DAPH / AD/18/1/60

දිනය :2025.03.30

ආගමන විගමන පාලක ජනරාල්,
ආගමන විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
ශ්‍රී සුභූතිපාර,
බත්තරමුල්ල.

<u>විදේශගත වී නැවත සේවයට වාර්තා නොකළ නිලධාරීන් සම්බන්ධවයි.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ DAPH / AD/17/නීති/2024/04 හා 2025.01.31 දිනැති ලිපිය හා බැදේ.

02. එමගින් මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිට විදේශගතවී නැවත සේවයට වාර්තා නොකර දණ්ඩන මුදල් ගෙවීම පැහැර හැර ඇති නිලධාරීන් ලංකාවට පැමිණීමේදී මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලෙස ඉල්ලා ඇත.

03. උක්ත ඡේදයේ සඳහන් පහත විස්තර ඇතුළත් නිලධාරිණිය, මේ වන තෙක් ලංකා රජයට අයවිය යුතු දණ්ඩන මුදල් ගෙවීම පැහැරහැර ඇති බැවින්, ඇය ශ්‍රී ලංකාවට පැමිණීමේදී ඒ පිළිබඳව මෙහි සඳහන් දුරකථන අංකයට දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

| නම | තනතුර | ජාතික හැඳුනුම්පත් අංකය | විදේශගතවී ඇති රට | ලංකාවට පැමිණීමේදී දැනුම්දිය යුතු දුරකථන අංකය |
|---|---|---|---|---|
| එම්. නන්දා නායකරත්න මිය | පශු වෛද්‍ය නිලධාරී | 527983673 V | ඕස්ට්‍රේලියාව | 0765708103<br>ටී.ඒ.ඒ.එම්.ඒකනායක මිය ,<br>සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) |

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

o/c

පිටපත :

01. අධ්‍යක්ෂ (පරිපාලන) මගින්
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - කරු. දැ.ගැ.පි.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
Department of Animal Production and Health

ජනරාල්
பணிப்பாளர் நாயகம் } +94-081-2388195
General
@sltnet.lk

කාර්යාලය
அலுவலகம் } +94 081 2388120
Office 184/189/11/162

Web www.daph.gov.lk

දිනය : 2025.04. 10

මගේ අංක : DAPH /AD/18/1/60

නන්දා නායකරත්න මිය,
නො. 224,
කිරිදිවැල පාර,
රදාවාන.

**විදේශගත වී නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධව**

ඔබ මෙම දෙපාර්තමේන්තුවෙහි පශු වෛද්‍ය නිලධාරි ලෙස සේවය කරමින් සිට 1991.06.07 දින සිට 1994.12.31 දක්වා රැකියාවක් සහ අධ්‍යයන කටයුතු සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන ඇත. 1994.12.31 දින වැටුප් රහිත විදේශ නිවාඩුව අවසන් වුවද ඔබ නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 1995.01.01 දිනැතිව තනතුර අතහැරයාමේ නියෝගය නිකුත්කර ඇත.

02. ඔබ විදේශගතවීමේදී අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව රු.98,049.63 ක දණ්ඩන මුදලක් ශ්‍රී ලංකා රජය වෙත ගෙවිය යුතුව ඇත. අදාල මුදල මේ දක්වා ගෙවීම ඔබ විසින් පැහැර හැර ඇති බැවින් එම මුදල කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

ඩබ්ලිව්.එම්.ටී.ඩී.කේ. වීරකෝන්
අධ්‍යක්ෂ (පරිපාලන)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ - පේරාදෙණිය

ඩබ්. ඩබ්.එම්.ටී.ඩී.කේ. වීරකෝන්
අධ්‍යක්ෂ (පරිපාලන)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත :

01. නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

- MR 29052 නඩුවට අදාල ඉදිරි කටයුතු සඳහා (දිසා අධිකරණය මහනුවර)

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
Department of Animal Production and Health

...පතිජල / ...நாயகம் / ...eneral +94-081-2388195
...ph@sltnet.lk

කාර්යාලය / அலுவலகம் / Office +94 081-2388 184/189/337/...
Web : www.daph.gov.lk

මගේ අංකය : DAPH/AD/18/1/60 ඔබේ අංකය: C/10/1997 (CJ) දිනය : 2022.10.17

ලියාපදිංචි තැපෑලෙනි

නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

**මහනුවර දිසා අධිකරණ නඩු අංක 29052/MR**

උක්ත නඩු අංකය යටතේ, අප දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය නිලධාරිනියක ලෙස සේවය කරමින් සිට විදේශගත වී නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් එම්. නන්දා නායකරත්න යන අයගෙන් රජයට අයවිය යුතු රු. 98,049/- ක මුදල අයකර ගැනීම සඳහා මහනුවර දිසා අධිකරණයේ පවත්වාගෙන ගිය නඩුව සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

02. අදාල විත්තිකාරිය දැනටත් විදේශගත වී සිටින බවත් ඇයගේ නිවැරදි ලිපිනය සොයා ගැනීමට නොහැකි වීම මත 2015.08.12 දිනෙන් පසු මෙම නඩුව ක්‍රියාත්මක වී නොමැති බවත් නිරීක්ෂණය වේ.

03. වර්තමානයේ මුදලේ අගය ක්‍රමයෙන් අවප්‍රමාණය වීමත් සමග රු. 98,049/- ක වැනි මුදලක් අයකර ගැනීම වෙනුවෙන් විත්තිකාරියට එරෙහිව නඩුව නැවත සක්‍රිය කර පවත්වාගෙන යාම ප්‍රයෝගික නොවන බවට නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා ඔබගේ උපදෙස් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

එල්.ඒ.ඩී. ගීතා ඉන්ද්‍රාණි
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

0/c

2026-02-11

C/10/1997 (CJ)

DAPH/AD/18/1/60

තැ.පෙ.අංකය
அஞ்சல் பெட்டி
P.O. Box No. 502

කොළඹ 12.
கொழும்பு 12.
Colombo 12.

# නීතිපති දෙපාර්තමේන්තුව
# சட்டமா அதிபர் திணைக்களம்
# ATTORNEY - GENERAL'S DEPARTMENT


2147888
2433967
2320800
2327919
2149001(2)

administration@attorneygeneral.gov.lk

2436421


2022-10-31

අධ්‍යක්ෂ ජනරාල්.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
පේරාදෙණිය.

**මහනුවර දිසා අධිකරණ නඩු අංක :29052/MR**

උක්ත කාරණය සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2022-10-17 ලිපියට තවදුරටත් වශයෙනි.

එහි සඳහන් කරුණු අනුව උක්ත නඩුව ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය තොරතුරු/ලේඛන ලබා දීම සම්බන්ධයෙන් මේ දක්වා පියවර ගෙන නොමැති බැවින් උක්ත නඩුව ඉල්ලා අස්කර ගැනීම සඳහා පියවර ගන්නා බව මෙයින් දැනුම් දෙමි.

ඒ ප්‍රකාරව අවශ්‍ය උපදෙස් යථා කාලයේ දී මහනුවර රජයේ නීතිඥ වෙත මෙම දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ඇත.

තවද මෙම කාරණය සම්බන්ධයෙන් අපගේ දෙපාර්තමේන්තු ගොනුවේ කටයුතු ද අවසන් කර ලේඛනාගාර ගත කරන බව ද වැඩි දුරටත් දැනුම් දෙමි.

3ස්නි ෆිර්දව්ස්.
ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ.